**<u>2025 වර්ෂය සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ</u>**
**<u>අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් අභියාචනා මණ්ඩල රැස්වීම - 2024.09.27</u>**

**<u>මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය</u>**

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන්ගේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් අභියාචනා මණ්ඩල රැස්වීම 2024.09.27 දින ප.ව. 02.30 ට භාණ්ඩාගාර නව ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරයේදී පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

<u>ස්ථාන මාරු මණ්ඩලය :</u>

**එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා** - සභාපති
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

**බී.ආර්.ඩී.සී. ගුණසේන මිය** - සාමාජික
අධ්‍යක්ෂ

**එන්.ටී. අමරතුංග මිය** - සාමාජික
නියෝජ්‍ය අධ්‍යක්ෂ

<u>**වෘත්තිය සමිති නියෝජිතයින් :**</u>

I. ඒ.ඩී.එච්. නයනජිත් මහතා - සභාපති
රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන්ගේ සංගමය

II. එම්.පී.එන්. ඩයස් මහත්මිය - මධ්‍යම කාරක සභික
කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ජාතික එකමුතුව

III. එස්.ඒ.ආර්.ඩී. සමරතුංග මහතා - මධ්‍යම කාරක සභික
සමස්ත ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ සංගමය

IV. එච්.එම්. තමරා දයානි මහත්මිය - ප්‍රධාන භාණ්ඩාගාරික
සමස්ත ලංකා කළමනාකරණ සේවා නිලධාරීන්ගේ සංගමය

02. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ සේවය කරන එන්.කේ.පී.කේ. නාගසිංහ මිය 2018.03.02 දින එම දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවීම් ලබා ඇති අතර එවකට මුදල් අමාත්‍යාංශ විෂය පථයට මෙම දෙපාර්තමේන්තුව අයත්ව නොතිබුනද 2019.12.10 දින සිට මුදල් අමාත්‍යාංශ විෂය පථයට මෙම දෙපාර්තමේන්තුව ඇතුළත් වීම මත ජ්‍යොෂ්ඨතා ලේඛණයෙහි එම නිලධාරිනිය 2019.12.10 දිනට ඇතුළත් කරන ලෙස ඉල්ලා අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

03. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා නිලධාරීන් 18 දෙනෙකු (මුදල් අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාව තුළ මෙම දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලැබූ) විසින් ඔවුන් එම දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වූ දිනය සලකා එම දෙපාර්තමේන්තුව නැවත මුදල් අමාත්‍යාංශ විෂය පථයට අයත් වූ 2019.12.10 හා 2022.04.28 දිනට අදාළව ජ්‍යොෂ්ඨතා ලේඛණයට ඇතුළත් කරන ලෙස ඉල්ලා අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

04. රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලැබීම සඳහා සාමාන්‍යයෙන් ජ්‍යොෂ්ඨතා ලේඛනය තුළ රැඳී සිටිය යුතු කාලසීමාව අවුරුදු 07ක් පමණ වුවද මෙවර පළකරන ලද ජ්‍යොෂ්ඨතා ලේඛනය අනුව රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු ලැබීම සඳහා ජ්‍යොෂ්ඨතා ලේඛනයෙහි අවුරුදු 10ට අධික කාලයක් රැඳී සිටීමට සිදුවන බැවින් ඒ සඳහා සහනයක් ලබාදෙන ලෙස ඉල්ලා මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා නිලධාරීන් විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

05. ඉහත අභියාචනා සම්බන්ධයෙන් අභියාචනා කමිටුවේ ඒකමතික තීරණය වූයේ ප්‍රායෝගික කරුණු හා ඉදිරියේදී ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් මතුවිය හැකි ගැටලුකාරී තත්වයන් මගහරවා ගැනීම පිළිබඳ සලකාබලා මුදල් අමාත්‍යාංශ විෂය පථයට වරින් වර එක්වූ හා ඉවත් වූ සියලු දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරීන් අතුරින් මුදල් අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාවන් තුළදී එම දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු වූ නිලධාරීන් ජ්‍යෙෂ්ඨතා ලේඛණයට ඇතුළත් නොකරන ලෙසය.

06. ඒ අනුව, මුදල් අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාවන් තුළ එම දෙපාර්තමේන්තු වෙත පැමිණි නිලධාරීන්ට මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලැබීමේ අවස්ථාවක් ලබාදිය නොහැකි බැවින් හා යම් නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් මුදල් අමාත්‍යාංශය වෙත හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක් වෙත ස්ථාන මාරු ලැබීමෙන් පමණක් මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලැබීමේ අවස්ථාවක් ලැබෙන බැවින් එම නිලධාරීන් ජ්‍යෙෂ්ඨතා ලේඛනයෙන් ඉවත්කිරීමට අභියාචනා මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

07. මුදල් අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාවන් තුළ එම දෙපාර්තමේන්තු වෙත පැමිණි නිලධාරීන්ට මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලැබීමේ අවස්ථාවක් ලබාදිය නොහැකි බවත්, යම් නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් මුදල් අමාත්‍යාංශය වෙත හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක් වෙත ස්ථාන මාරු ලැබීමෙන් පමණක් මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලැබීමේ අවස්ථාවක් ලැබෙන බවත් අභියාචනා මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

08. එසේම, මින් ඉදිරියට මුදල් අමාත්‍යාංශය හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක් වෙත ස්ථාන මාරු ලබන නිලධාරීන්ගේ සේවා කාලය අවම වශයෙන් අවුරුදු 10ක් සම්පූර්ණ කර තිබිය යුතු බව අවධාරණය කරන ලද අතර ඉදිරියේදී මුදල් අමාත්‍යාංශය හෝ ඒ යටතේ ඇති වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත කළමනාකරණ සේවා නිලධාරීන් ස්ථාන මාරු කිරීමේදී හා පුරප්පාඩු ලිපි නිකුත් කිරීමේදී ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරන ලෙස වැඩිදුරටත් සඳහන් කරන ලදී.

09. තවද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සේවය කරන බී.ඩී.ඩී. අබේසුන්දර මිය විසින් වයස අවු. 55 සම්පූර්ණ වීම මත කඩිනමින් රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුකරන ලෙස දන්වමින් ආයතන ප්‍රධානීන් මගින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. 10.2 පදනම යටතේ රේගුව වෙත ස්ථාන මාරුවීම සඳහා ලබාදී ඇති වරප්‍රසාදය මෙම අමාත්‍යාංශයට පැමිණි දිනය හා වයස අවුරුදු 55 සම්පූර්ණ කිරීම අනුව මෙම අමාත්‍යාංශයේ සපුරා ඇති සේවා කාලය පදනම්ව හිමිවන බැවින් එම අභියාචනා පිළිබඳව සලකාබැලිය නොහැකි බව අභියාචනා මණ්ඩලය විසින් දන්වන ලදී.

| | | |
|---|---|---|
| | 27.09.2024 | 27/09/2024 |
| ..................................... | ..................................... | ..................................... |
| එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර | බී.ආර්.ඩී.සී. ගුණසේන | එන්.ටී. අමරතුංග |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| (සභාපති) | (සාමාජික) | (සාමාජික) |
| මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| M.M.C.P. Mohottigedara<br>Additional Director General<br>Ministry of Finance, Planning and Economic Development<br>Colombo 01 | බී.ආර්.දිනූෂා සී.ගුණසේන<br>අධ්‍යක්ෂ<br>මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br>කොළඹ 01 | එන්.ටී. අමරතුංග<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br>කොළඹ 01 |

**<u>2025 වර්ෂය සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ</u>**
**<u>අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් අභියාචනා මණ්ඩල රැස්වීම II - 2024.10.29</u>**

**<u>මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය</u>**

අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් අභියාචනා මණ්ඩල රැස්වීමේදී,මුදල් අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාවන් තුළ එක් එක් දෙපාර්තමේන්තු වෙත පැමිණි නිලධාරීන් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු යෝජ්‍යතා ලේඛනයෙන් ඉවත්කිරීමට ගනු ලැබූ තීරණය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ අභියාචනා හේතුවෙන් 2024.10.29 දින පෙ.ව. 09.30 ට අතිරේක ලේකම්, ඩී.එච්.එස්. පුල්ලපෙරුම මියගේ ප්‍රධානත්වයෙන් භාණ්ඩාගාර නව ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරයේදී පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී.

<u>සහභාගී වූ පිරිස :</u>

**එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

**බී.ආර්.ඩී.සී. ගුණසේන මිය**
අධ්‍යක්ෂ

**එච්.ජී.වී.කේ. පලන්සූරිය මෙය**
සහකාර ලේකම්

**<u>වෘත්තීය සමිති නියෝජිතයින් :</u>**

I. ඒ.ඩී.එච්. නයනජිත් මහතා - සභාපති
රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන්ගේ සංගමය

II. රෝහිත සෙනෙවිරත්න මහතා - භාණ්ඩාගාරික
කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ජාතික එකමුතුව

III. එම්.පී.එන්. ඩයස් මහත්මිය - මධ්‍යම කාරක සභික
කළමනාකරණ සේවා නිලධාරීන්ගේ ජාතික එකමුතුව

IV. කේ. සමන්කුමාර ශ්‍රේරු මහතා - ප්‍රධාන භාණ්ඩාගාරික
සමස්ත ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ සංගමය

V. එච්.එම්. තමරා දයානි මහත්මිය - ප්‍රධාන භාණ්ඩාගාරික
සමස්ත ලංකා කළමනාකරණ සේවා නිලධාරීන්ගේ සංගමය

2024.09.27 දින පැවති අභ්‍යන්තර ස්ථාන මාරු අභියාචනා මණ්ඩලය විසින් අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාවන් තුළදී එක් එක් දෙපාර්තමේන්තු වෙත පැමිණි නිලධාරීන් යෝජ්‍යතා ලේඛනයෙන් ඉවත් කිරීමට ගනු ලැබූ තීරණය සම්බන්ධයෙන් එම නිලධාරීන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කිරීම හේතුවෙන් 2024.10.29 දින නැවත වෘත්තීය සමිති නියෝජිතයින්ගේ එකතුවෙන් සාකච්ඡාවක් පවත්වන ලදී.

එහිදී මුදල් අමාත්‍යාංශ පරිශ්‍රය තුළ ස්ථාපිත ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාව තුළ පැමිණි නිලධාරීන් අදාළ දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ විෂය පථයට අයත් වූ දිනට යෝජ්‍යතා ලේඛනයට ඇතුළත් කිරීමටත්, අමාත්‍යාංශ පරිශ්‍රයෙන් පිටත පිහිටි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ආනයන හා

අපනයන පාලන දෙපාර්තමේන්තුව හා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ කාලසීමාව තුළ පැමිණි නිලධාරීන් 2023.12.31 දිනට ජ්‍යෙෂ්ඨතා ලේඛනයට ඇතුළත් කිරීමටත් තීරණය කරන ලදී.

එසේම, ඉදිරියේදී මෙම අමාත්‍යාංශය වෙත හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක් වෙත කළමනාකරණ සේවා නිලධාරී, කාර්යාල කාර්ය සහායක හා රියදුරු තනතුරු සඳහා පුරප්පාඩු ලිපි නිකුත් කිරීමේදී අවම සේවා කාලය වසර 10ක් සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳව සැලකිලිමත් වන ලෙසත් සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් අවම සේවා කාලය සලකාබැලීම අනවශ්‍ය බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

..............................................
**එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල්, ආර්ථික සංවර්ධන,
ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ
සංචාරක අමාත්‍යාංශය

එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ 01

29.10.2024
..............................................
**බී.ආර්.ඩී.සී. ගුණසේන**
අධ්‍යක්ෂ
මුදල්, ආර්ථික සංවර්ධන,
ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ
සංචාරක අමාත්‍යාංශය

..............................................
**එච්.ඒ.වී.කේ. පලන්සූරිය**
සහකාර ලේකම්
මුදල්, ආර්ථික සංවර්ධන,
ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම්
සහ සංචාරක අමාත්‍යාංශය

එච්.ඒ.වී.කේ. පලන්සූරිය
සහකාර ලේකම්
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ 01